සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2023 (2024)
ஆண்டிறுதிப் பரீட்சை - 2023 (2024)/ Final Term Test - 2023 (2024)

ශ්‍රේණිය / தரம் / Grade } 9 ශ්‍රේණිය

# විද්‍යාව

කාලය / நேரம் / Time } පැය 2 විනාඩි 30 යි

නම / பெயர் / Name } ..............................

විභාග අංකය / சுட்டிலக்கம் / Index No. } ..............................

## I කොටස

- සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. පහත සඳහන් ක්ෂුද්‍ර ජීවීන් අතරින් ඇල්ගී කාණ්ඩයට අයත්වන ක්ෂුද්‍ර ජීවියා තෝරන්න.
(1) ඇමීබා (2) ප්ලැස්මෝඩියම් (3) ක්ලැමිඩොමොනාස් (4) පැරමීසියම්

02. ඇස තුළට ඇතුළුවන ආලෝක ප්‍රමාණය පාලනය කිරීමට උදව් වන ඇස තුළ වූ ව්‍යුහය වන්නේ,
(1) කණිනිකාව යි. (2) ප්‍රතියෝජක පේශිය යි. (3) තාරා මණ්ඩලය යි. (4) අක්ෂි පේශි යි.

03. නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) ජලය මූල ද්‍රව්‍යයකි.
(2) ඇතැම් මූලද්‍රව්‍ය සංකේත සඳහා ලතින් අකුරු භාවිත කරයි.
(3) සංයෝග වල තැනුම් ඒකකය අණු ය.
(4) පරමාණුව තුළ වැඩි ප්‍රදේශයක් හිස් අවකාශයකි.

04. පහත ප්‍රකාශ දෙක පිළිබඳ සලකා බලන්න.
A - බලයට විශාලත්වයක් ඇත. දිශාවක් නැත. B - බලය අදිශ රාශියකි.
ඉහත ප්‍රකාශ දෙකෙන්,
(1) A සත්‍යය යි. B අසත්‍ය යි. (2) A අසත්‍යය යි. B සත්‍ය යි.
(3) ප්‍රකාශ දෙකම සත්‍ය යි. (4) ප්‍රකාශ දෙකම අසත්‍ය යි.

05. එදිනෙදා ජීවිතයේ දී පීඩනය අඩු කර ගැනීමට යොදා ගන්නා උපක්‍රමයක් වන්නේ,
(1) ආයුධ මුවහත් කිරීම. (3) බර වාහන වල රෝද සංඛ්‍යාව වැඩි කිරීම.
(2) අඩි උස සෙරෙප්පු භාවිතය. (4) සබන් කැපීමට සිහින් නූලක් භාවිතා කිරීම.

06. වැරදි ප්‍රකාශය තෝරන්න.
(1) ධමනි මගින් හෘදයෙන් ඉවතට රුධිරය ගෙන යයි.
(2) ශිරා ඇතුළත කපාට ඇත.
(3) මිනිස් රුධිරයේ ප්ලාස්මාව 45% ක් ද, දේහානු 55% ක් ද ඇත.
(4) අනු ශිරා එකතු වී ශිරා සෑදේ.

07. ශාක තුළ සෛල විභාජනය වේගවත් කරන වර්ධක ද්‍රව්‍යය කුමක් ද?

(1) සයිටොකයිනින් (2) ගිබරලින් (3) ඔක්සින් (4) ඉන්ඩෝල් ඇසිටික් ඇසිඩ්

08. පහත ප්‍රකාශ පිළිබඳ අවධානය යොමු කරන්න.

A - සතුන්ගේ චලන සඳහා මෙන් ම සන්ධාරණය සඳහා ද අස්ථි උදව් වේ.

B - සෑම සතෙකුගේම සංචරණයට උදව් වන්නේ අස්ථියි.

C - ආවර්තී චලන යනු උත්තේජය දෙසට ප්‍රතිචාර දක්වන ආකාරයේ ශාක චලනයි.

ඉහත ප්‍රකාශ අතරින් නිවැරදි ප්‍රකාශය/ප්‍රකාශ වන්නේ,

(1) A පමණි (2) B පමණි (3) B හා C පමණි (4) A, B හා C යන සියල්ල

09. පහත සඳහන් දෑ අතරින් ෆොසිලයක් නොවන්නේ කුමක් ද?

(1) ලාම්පු බෙල්ලා

(2) මුහුදු වෙරළෙන් හමු වූ සිප්පි කටුවක්

(3) අයිස් තට්ටු තුළින් හමු වූ මැමත් සතෙකුගේ අස්ථි

(4) පොළව කැනීමේ දී හමු වූ ආදි මානවයාගේ හිස් කබලක්

10. සත්‍ය ප්‍රකාශය තෝරන්න.

(1) ප්ලැටිනම් ලෝහය අක්‍රීය ඉලෙක්ට්‍රෝඩයක් ලෙස භාවිත කළ හැකි ය.

(2) මද්‍යසාර විද්‍යුත් විච්ඡේද්‍යයකි.

(3) අල්පාම්ලිත ජලය විද්‍යුත් විච්ඡේදනයේ දී ධන ඉලෙක්ට්‍රෝඩය අසළින් හයිඩ්‍රජන් වායුව පිටවේ.

(4) විද්‍යුත් ලෝහාලේපනයේ දී උපකරණය භාවිත කළ යුත්තේ ධන ඉලෙක්ට්‍රෝඩයටයි.

11. ශ්‍රී ලංකාවට ආවේණික සත්ත්ව විශේෂ පමණක් අඩංගු පිළිතුර තෝරන්න.

(1) කැහිබෙල්ලා, වළි කුකුළා, ගිරවා

(2) කැහිබෙල්ලා, වළි කුකුළා, පළාපොළඟා

(3) කැහිබෙල්ලා, නයා, පළාපොළඟා

(4) මන්නාවා, නයා, පළාපොළඟා

12. රූපයේ පරිදි තල දර්පණයක් මතට පටු ලේසර් ආලෝක ධාරාවක් කඩදාසියේ ස්පර්ශ වෙමින් පතනය වීමට සලස්වයි. එවිට පරාවර්තන ආලෝක ධාරාව ගමන් කරන්නේ,

(1) කඩදාසියෙන් ඉහළට යි.

(2) කඩදාසියෙන් පහළට යි.

(3) කඩදාසියේ ස්පර්ශ වෙමිනි.

(4) දර්පණය විනිවිද පිටුපසට යි.



13. ස්වාභාවික ජලජ පරිසර පද්ධතියට අයත් නොවන්නේ මින් කවරක් ද?

(1) මිරිදිය (2) කරදිය (3) පිනිදිය (4) කිවුල් දිය

14. ගොඩනැගිලි ඉදි කිරීමේ දී හරිත සංකල්පය භාවිත කර ඇති අවස්ථාවක් වන්නේ මින් කුමක් ද?

(1) ස්වාභාවික ආලෝකය හොඳින් ලබා ගත හැකි පරිදි සකසා තිබීම.

(2) නිවසේ කොළ පැහැති තීන්ත ආලේප කර තිබීම.

(3) විදුලි බුබුලු හා වායු සමීකරණ යන්ත්‍ර උපරිමව යොදා නිවස සැකසීම.

(4) ආනයනික කෘත්‍රිම ද්‍රව්‍ය යොදා නිවස ඉදි කිරීම.

15. කාබන් පිය සටහන සඳහා හිතකරව දායක වීම පෙන්වන හොඳම අවස්ථාව තෝරන්න.

(1) පාන් ආහාරයට ගැනීම. (2) ආනයනික බිත්තර ආහාරයට ගැනීම.

(3) චීස් ආහාරයට ගැනීම. (4) කොස් ආහාරයට ගැනීම.

16. නැනෝ තාක්ෂණයට භාවිත කරන්නේ පහත කුමන පරිමාණයේ අංශු ද?

(1) 1 nm - 10 nm දක්වා (2) 1 nm - 50 nm දක්වා

(3) 1 nm - 75 nm දක්වා (4) 1 nm - 100 nm දක්වා

17. කාබන් පරමාණු 60 ක් පමණ පාපන්දුවක ආකාරයට සකස් වීමෙන් සැකසුණු අණුව හඳුන්වන නම වන්නේ,

(1) ෆුලරීන් ය. (2) කාබන් නැනෝ නළය (3) ග්‍රැෆීන්ය (4) දියමන්තිය

18. ශෂ්‍ය මාරු වගාව ලෙසට හඳුන්වන්නේ මින් කුමන ආකාරයක වගා කිරීමක් ද?

(1) වගා බිමක බෝග කිහිපයක් එකවර වගා කිරීම.

(2) කන්නයෙන් කන්නයට බෝග මාරු කරමින් වගා කිරීම.

(3) ජෛව තාක්ෂණයෙන් වැඩි දියුණු කළ බෝග පමණක් වගා කිරීම.

(4) පලිබෝධ ප්‍රතිරෝධී බෝග මාදිලි වගා කිරීම.

19. අකුණු සහිත අවස්ථාවක දී ආරක්ෂිත වන්නේ පහත කුමන අවස්ථාව ද?

(1) දෙපා ඈත් කර එළිමහනේ සිටීම. (2) ඇඳක් මත වැතිරී සිටීම.

(3) උස ගසක් යටට සිටීම. (4) ක්‍රීඩා පිටියක සිටීම.

20. ඛනිජ ද්‍රව්‍ය පමණක් අඩංගු පිළිතුර තෝරන්න.

(1) මිනිරන්, නයිස්, ඉල්මනයිට්, රූටයිල්

(2) ඉල්මනයිට්, ග්‍රැනයිට්, රූටයිල්, සර්කෝන්

(3) රූටයිල්, සර්කෝන්, ඇපටයිට්, සිලිකා වැලි

(4) මිනිරන්, තිරුවානා, සිලිකා වැලි, හුණු ගල්

# II කොටස

- පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.

(1) (A) ක්ෂුද්‍ර ජීවී ආසාදන හේතුවෙන් හට ගන්නා රෝග කිහිපයක් පිළිබඳ තොරතුරු පහත වගුවේ දැක් වේ.

| රෝගය | ව්‍යාධිජනකයා අයත් වන ක්ෂුද්‍ර ජීවී කාණ්ඩය |
|---|---|
| 1. සෙම්ප්‍රතිශ්‍යාව | වෛරස් |
| 2. ක්ෂය රෝගය | X |
| 3. මැලේරියාව | ප්‍රොටෝසෝවා |
| 4. අලුහම් | Y |
| 5. ඒඩ්ස් | වෛරස් |

(i) X හා Y ලෙස දක්වා ඇති ක්ෂුද්‍ර ජීවී කාණ්ඩ නම් කරන්න.

(ii) මිනිසාට ප්‍රයෝජන ගෙන දෙන ක්ෂුද්‍ර ජීවීන් ද සිටී. පහත දී ඇති එක් එක් කාණ්ඩයේ ක්ෂුද්‍ර ජීවීන් භාවිත කරන කර්මාන්තයක් බැගින් ලියන්න.

a - බැක්ටීරියා          b - දිලීර

(iii) ජෛව ප්‍රතිකර්මණය යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද?

(iv) ඒ සඳහා උදව් කර ගන්නා බැක්ටීරියාවක් නම් කරන්න.

(v) පෘථිවිය මත ජීවීන් සම්භවය වීමේ දී මුලින් ම බිහි වී ඇත්තේ ද ක්ෂුද්‍ර ජීවීන් ය.

එම ක්ෂුද්‍ර ජීවීන් හඳුන්වන්නේ කුමන නමින් ද?

(B) කාලයක් තිස්සේ ශාකයක් ඒක පාර්ශ්වික ආලෝකයට නිරාවරණය වී පැවතුණ හොත් ශාකයෙහි වෙනස්කම් ඇති වේ.

(i) එහි දී දක්නට ලැබෙන කැපී පෙනෙන වෙනස කුමක් ද?

(ii) එම වෙනස කුමන වර්ගයේ ශාක චලනයක් ද?

(iii) ශාක චලන සඳහා ශාක තුළම නිපදවෙන එක්තරා රසායනික ද්‍රව්‍ය කාණ්ඩයක් දායක වේ. එම ද්‍රව්‍ය කාණ්ඩය නම් කරන්න.

(iv) පහත සඳහන් එක් එක් කාණ්ඩයේ ශාකවල සන්ධාරණයට උදව් වන ද්‍රව්‍යයක් බැගින් ලියන්න.

a. අකාෂ්ඨීය ශාක -          b. කාෂ්ඨීය ශාක -

(v) මිනිස් දේහයේ

a. සන්ධාරණයට -          b. චලනයට -

දායක වන ශරීර පටක මොනවා දැයි ඉදිරියෙන් ලියන්න.

24273

(2) (A) (i) රූපයේ පෙන්වා ඇති මිනිස් ශරීර අවයවයේ කාර්යය ලියන්න.



(ii) එම අවයවයට සම්බන්ධ ධමනියක හා ශිරාවක ව්‍යුහමය වෙනසක් ලියන්න.

(iii) රෝගකාරක විෂ බීජ විනාශ කිරීමට උදව් වන රුධිරයේ අඩංගු දේහානු වර්ගය නම් කරන්න.

(iv) AB නෙගටිව් රුධිරය පාරවිලයනය කළ හැකි AB එම වර්ගය හැර වෙනත් ලේ වර්ගයක නම ලියන්න.

(v) රුධිර සංසරණ පද්ධතියේ යහපැවැත්ම උදෙසා අනුගමනය කළ යුතු යහපත් පුරුද්දක් ලියන්න.

(B) දෝෂ සහිත මිනිස් ඇසක රූපයක් පහත දක්වේ.



(i) එම අක්ෂි දෝෂය කුමක් ද?

(ii) ඊට පිළියම් ලෙස භාවිත කරන උපැස් වල යොදා ගන්නේ කුමන කාච වර්ගය ද?

(iii) ඇසේ ප්‍රතියෝජක පේශී වල කාර්යය ලියන්න.

(iv) ඇස මෙන් ම මිනිස් කන ද ඉතා වැදගත් අවයවයකි. මැද කනට අයත් කොටසක් නම් කරන්න.

(v) ඔබ නම් කළ එම කොටසේ කාර්යය කුමක් ද?

(vi) කනේ ආරක්ෂාවට අනුගමනය කළ යුතු යහපත් පුරුද්දක් ලියන්න.

(3) තෙත, සියුම් වැලි තට්ටුවක් මත තබා ඇති ඝනකාභ හැඩැති වස්තුවක් රූපයෙන් පෙන්වයි. වස්තුවේ බර 8 N කි.




(i) වැලි මත ක්‍රියා කරන අභිලම්භ බලය කීය ද?

(ii) බලය දෛශික රාශියක් යැයි කියන්නේ ඇයි?

(iii) වස්තුවක් මත බලයක් ක්‍රියා කරන ලක්ෂ්‍යය හඳුන්වන්නේ කුමන නමකින් ද?

(iv) වස්තුව ඉවතට ගත් විට එය තිබූ ස්ථානයේ වැලි තට්ටුව ඇතුළට ගිලා බැස තිබුණි. ඒ ඇයි?

(v) වස්තුවේ B පෘෂ්ඨය වැලි තට්ටුව මත ස්පර්ශ වන සේ වස්තුව තැබූ විට එම ගිලා බැසීම අඩු ද? නැතහොත් වැඩි ද?

(vi) $4m^2$ ක වර්ගඵලයක් මත අභිලම්භව ක්‍රියාත්මක 20 N ක බලයකින් ඇති කරන පීඩනය ගණනය කරන්න.

(vii) වැලි තුළ අන්තර්ගත වන ප්‍රධාන සංයෝගය සිලිකන් ඩයොක්සයිඩ් ය. එහි වූ ඔක්සිජන් පරමාණුවක ප්‍රෝටෝන 8 ක් ඇත. එසේ නම් එම පරමාණුවක ඉලෙක්ට්‍රෝන කීයක් තිබේ ද?

(viii) එහි නියුට්‍රෝන 8 ක් ඇත්නම් මූලද්‍රව්‍ය සංකේතය සමඟ එම පරමාණුවේ පරමාණුක ක්‍රමාංකය හා ස්කන්ධ ක්‍රමාංකය සම්මත ආකාරයට ලියා දක්වන්න.

(4) (A) රූපයේ දක්වෙන්නේ කාබන් ඉලෙක්ට්‍රෝඩ යොදා ගත් විද්‍යුත් විච්ඡේදන කෝෂයක රූපයකි.




(i) X හා Y ඉලෙක්ට්‍රෝඩ දෙකෙන් ධන ඉලෙක්ට්‍රෝඩය හා සෘණ ඉලෙක්ට්‍රෝඩය වන්නේ කුමක් දැයි වෙන වෙන ම දක්වන්න.

(ii) විද්‍යුත් විච්ඡේදනය යනු කුමක් ද?

(iii) යකඩ යතුරක තඹ ආලේප කිරීමට අවශ්‍යව ඇත. ඒ සඳහා යතුර සම්බන්ධ කළ යුත්තේ X ඉලෙක්ට්‍රෝඩයට ද නැතහොත් Y ඉලෙක්ට්‍රෝඩයට ද?

(iv) එවිට විද්‍යුත් විච්ඡේද්‍යය ලෙස යොදා ගත හැකි රසායනික ද්‍රව්‍යයක නම ලියන්න.

(B) (i) අකුණු ගැසීමේ දී ආලෝකය පළමුව පෙනී ශබ්දය පසුව ඇසෙන්නේ ඇයි?

(ii) වායු ගෝලයේ ඇති වන කුමන වෙනසක් නිසා සුළි සුළං හා කුණාටු නිර්මාණය වේ ද?

(iii) සුනාමි ඇති වීමට බලපාන හේතු 02 ක් ලියන්න.

(iv) වායු ගෝලීය උණුසුම වැඩි වීමට බලපාන වායු 02 ක් නම් කරන්න.

(5) (A) (i) යම් ද්‍රව්‍යයක ඝනත්වය මැනීමට කුමන රාශි අපට අවශ්‍යය ද?

(ii) ඝනත්වය මැනීමේ SI ඒකක දක්වන්න.

(iii) ජලය සහ භූමිතෙල් වෙන වෙන ම අඩංගු වන මිනුම් සරා දෙකක් තුළ ද්‍රවමානයක් ගිල් වූ විට ද්‍රවමානය වැඩිපුර ගිලෙන්නේ කුමන ද්‍රව්‍යය තුළ ද?

(B) (i) සවිධි පරාවර්තනයක් සිදු වන්නේ කුමන ආකාරයේ පෘෂ්ඨ වලින් ද?

(ii) තල දර්පණයක් ඉදිරියේ තැබූ වස්තුවකින් සෑදෙන ප්‍රතිබිම්බයේ ලක්ෂණ 02 ක් සඳහන් කරන්න.

(iii) තල දර්පණ 02 ක් භාවිතයෙන් සෑදිය හැකි මෙවලම් දෙකක් නම් කරන්න.

(iv) සූර්යාලෝකයේ වර්ණ වෙන් කර ගැනීමට භාවිත කළ හැකි විද්‍යාගාර උපකරණයක් නම් කරන්න.

(v) අති ධ්වනි තරංග භාවිතයට ගන්නා අවස්ථාවක් සඳහන් කරන්න.

(6) (A) වැඩ පහසු කර ගැනීමට සරල යන්ත්‍ර භාවිත කරයි.

(i) සරල යන්ත්‍ර වර්ග 04 ක් නම් කරන්න.

(ii) රූපයේ පරිදි 44 N භාරයක් 11 N ආයාසයක් යොදමින් ඔසවයි. මෙහි යාන්ත්‍ර වාසිය කොපමණ ද?




(iii) ස්කුරුප්පු ඇණය සහ ස්කුරුප්පු නියන කුමන සරල යන්ත්‍ර වලට අයත් දැයි පිළිවෙලින් දක්වන්න.

(iv) ප්‍රවේග අනුපාතය සාමාන්‍යයෙන් 1 ක් වන්නේ කුමන සරල යන්ත්‍රවල ද?

(B) නැනෝ පරිමාණයේ සැකසුම් සහිතව පවතින ස්වාභාවික සංසිද්ධි / ක්‍රියාවලි 02 ක් සඳහන් කරන්න.

LOL.lk
BookStore

# විභාග ඉලක්ක පහසුවෙන් ජයගන්න

ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න





| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට

**www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න**